# 10

# අර්ථාවබෝධය

භාෂාව ලේඛනයට නැගීමේදී ත් භාෂණයට නැගීමේ දීත් සිදු වන්නේ එක ම කාර්යයකි. එනම් අදහස් ප්‍රකාශ කිරීම යි. එම ප්‍රකාශිත අදහස්හි අරුත් නිවැරදි ව වැටහීමෙන් පමණක් ම භාෂාවේ කාර්යය ඉටු වේ. භාෂණයේදී ප්‍රකාශ වන අදහස් වටහා ගැනීමට යම් බඳු පහසුකමක් ඇත. භාෂණය, අභිමුඛව සිදු වන නිසා නැවත නැවත විමසිය හැකි වීම, ඉඟි, සංඥා වැනි දේ ඇසුරු කිරීමට හැකි වීම ඊට හේතු යි. එහෙත් ලේඛනයේදී ලේඛනය ම කියවා, බලා, අසා වටහා ගැනීමට සිදු වන නිසා වටහා ගැනීමේදී යම් යම් බාධා ඇති වේ.

ගද්‍ය වශයෙන් වේවා පද්‍ය වශයෙන් හෝ වේවා කුමන හෝ ලේඛනයක වුව ද අන්තර්ගත අරුත් නිවැරදිව වටහා ගැනීම ලේඛන ගත භාෂා අවබෝධයට මහෝපකාරී වේ. **අර්ථාවබෝධය** පාඩමෙන් උත්සාහ ගන්නේ එය පහසුවෙන් කළ හැකි ක්‍රමවේද මොනවා ද යි විමසා බැලීම යි.

## වදන් පෙරළිය

දෙණියේගෙදර වෙදආතා පොල්පිටිය ගමේ විසූ පාරම්පරික දේශීය වෛද්‍යවරයෙකි. වෙදහෙදකම්වලට අමතර ව ජ්‍යොතිෂ්‍ය කටයුතු ද සිදු කළ නිසා වෙදආතාට තරමක් අවිවේකය පැවතිය ද ලැබුණු හැම විට ම විනෝදයෙන් සැහැල්ලුවෙන් කල් ගෙවීම වෙද ආතා තුළ වූ විශේෂතාවකි.

සේදිරිස් ළමයා වෙද ආතාට සිටි කීකරු ආවතේවකරුවා ය. තරුණයකු වුව ද එතරම් උගත්කමක් නැති සේදිරිස් ළමයා වෙද ආතාට පිහිටවන්නේ තමන් දන්නා කියන බෙහෙත් අඩු-වැඩි ටික වෙද ආතාට සොයා දීමෙනි. දිනක් දකුණතින් හිසත් වමතින් ඉදිරියට නෙරූ උදරයත් පිරිමදිමින් සිටි වෙද ආතා වෙද කාමරයේ දොරකඩ ළඟ සිටි සේදිරිස් ළමයා අමතා **කල්පොට්ටක් සහ කරණ පහ** සොයා ගෙන එන ලෙස කීවේ ය. වෙනදා මෙන් වෙද ආතාගේ විධානය හිස් මුදුනින් පිළිගත් සේදිරිස් ළමයා වෙද ආතා කියූ කල්පොට්ට සහ කරණ පහ සොයමින් පළමුව වෙද ගෙදර පුරාත් අනතුරු ව මුළු පොල්පිටිය ගම පුරාත් ඇවිද හති දමමින් වෙදගෙදරට ආවේ,

"අනේ වෙදආතේ හැම තැන ම හෙව්වා කල්පොට්ට සහ කරණ පහ සොයා ගන්නට නොහැකි වුණානේ" යැයි පවසමිනි.

"ඈ සේදිරිස් ළමයෝ? උඹ ඕකට ඔය හැටි මහන්සි වුණේ ඇයි? උඹ නිකමටවත් මං කියපු දේ අනිත් පැත්ත පෙරළලා බැලුවෙ නෑ නේ? මං උඹට කිව්වේ පොල්කට්ටක් සහ පරණ කහ ගේන්න කියල නෙ...."

වෙදආතා එසේ කීවේ මුවගට නගා ගත් සිනහවක් ද සහිත ව ය. එය ඇසූ සේදිරිස් ළමයා ඔළුවේ අත ගසා ගත්තේ වෙද ආතාගේ විහිළුවකට තමන් අදත් අසු වුණු බව සිතමිනි.

මේ කතාවෙන් මතු වන එක අදහසක් නම් භාෂා අවබෝධයේදී විවිධ පැතිකඩ පිළිබඳ දැනුමක් සහිතව කටයුතු කළ යුතු බව යි. ඒ අනුව මෙම කතාවෙන් තහවුරු වන්නේ භාෂාවේ පද පෙරළි වශයෙන් තිබෙන අවස්ථා හඳුනා ගෙන භාෂාව අවබෝධ කර ගන්නට උත්සාහ ගත යුතු බව යි.

ගද්‍ය පද්‍ය වශයෙන් පමණක් නොව විවිධාකාර ප්‍රායෝගික ලේඛනවලත් පුවත්පත් ආදි ලියවිලිවලත් ඇති භාෂාව අවබෝධකර ගැනීමට උත්සාහ ගැනීමේදී ඒවායෙහි අර්ථ විවිධ වශයෙන් පවතින නිසා, ඊට අනුගත ව අවබෝධකර ගන්නට සිදු වේ. භාෂාවේ අර්ථ වටහා ගැනීම මූලික වශයෙන් ආකාර තුනකි.

1. වාච්‍යාර්ථය වටහා ගැනීම
2. ලක්ෂ්‍යාර්ථය වටහා ගැනීම
3. ව්‍යංග්‍යාර්ථය වටහා ගැනීම යනු යි.

## 1. වාච්‍යාර්ථය වටහා ගැනීම

වාච්‍යාර්ථය යනු වචනවල මතුපිටින් කියවෙන අර්ථය යි. එදිනෙදා ව්‍යවහාර බසින් සුසැදි ලේඛනවල වාච්‍යාර්ථය පහසුවෙන් වටහා ගත හැකි ය.

**"ඔබ නිවසේ රැඳී සිටින්න**
**මම නොපමාව එමි"**

යන වැකියේ භාවිත ව ඇත්තේ ව්‍යවහාර බස යි. ඒ නිසා අවබෝධය පහසු ය. මෙවැනි ව්‍යවහාර බසක් සහිත ඕනෑම ලේඛනයක පදයෙන්, පදය වැකියෙන්, වැකිය කියවීමෙන් සමස්ත ලේඛනයේ අන්තර්ගත අර්ථාවබෝධය ලද හැකි ය. එහෙත් පැරණි බස යෙදී ඇති "අදිති පෑයූ සඳ තුසර රැස් සිඳී යේ" යන වැකියේ
අර්ථ වටහා ගන්නට නම් වචනාර්ථ ව්‍යවහාර බසට නගා දැන ගත යුතු ය.

| | | |
|---|---|---|
| අදිති | - | සූර්යයා |
| පෑයූ සඳ | - | පෑයූ කල්හි |
| තුසර රැස් | - | පිනි බිඳු සමූහය |
| සිඳී යේ | - | සිඳී යයි |

ඒ අනුව ඉහත වැකියේ අර්ථය "සූර්යයා පෑයූ කල්හි පිනි බිඳු පහව යයි" යන්න යි. මෙසේ පැරණි බසේ අර්ථ වටහා ගන්නට නම් පැරණි භාෂාවේ ව්‍යවහාර අර්ථ පිළිබඳ වැටහීමක් පැවතිය යුතු ය.

## ක්‍රියාකාරකම 1

**පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. අදහස් ප්‍රකාශනයෙහිලා ඉවහල් වන ශබ්ද හා රීති සමූහය භාෂාව ලෙස හැඳින්වේ. භාෂාව ගැන පවත්නා දැනුම, ව්‍යාකරණය, රචනය, උච්චාරණය හා සාහිත්‍යයට පමණක් සීමා වූවක් නොවේ. එය පෘථුල ගම්භීරාර්ථයක් ප්‍රකට කරයි. සිතෙහි හටගන්නා අදහස් ලේඛන මාධ්‍යය තුළින් වෙනත් අයකුට පෙන්නුම් කිරීම සඳහා සංකේත යොදා ගැනේ. සංකේතාත්මක මාධ්‍යය තුළින් වෙනස් වන්නා වූ භාෂා දහස් ගණනක් ලොවෙහි පවතී. ඒවා මානව ශිෂ්ටාචාරයේ වර්ධනයත් සමග ඇති විය. ඇතැම් ඒවා කාලානුරූපව පරිහානියට පත් විය. පරිහානියට පත් ව පොදු ජන ව්‍යවහාරයෙන් ඉවත් වූ භාෂා මළ භාෂා ලෙස හැඳින්වේ.

i. භාෂාවේ අංග දෙක මොනවා ද?
ii. මළ භාෂා යනු මොනවා ද?
iii. සිතෙහි හටගන්නා අදහස් අන් අයට ඉදිරිපත් කිරීම සඳහා යොදා ගන්නේ මොනවා ද?
iv. මානව ශිෂ්ටාචාරයේ වර්ධනයත් සමග ඇති වූයේ මොනවා ද?
v. පෘථුල, ගම්භීර යන වචනවල අර්ථ ලියන්න.

2. එ වේලෙහි පූර්ණා නම් දාසී ද සුජාතාවන් කී බස් මුදුනෙන් පිළිගෙන අජපාල නුගරුක් මුලට ගොස් නිල් වලාකුළක් ළඟ ළහිරු මඬලක් මෙන් රන්වන් රසින් එරුක සාදා නැගෙනහිර බලා වැඩහුන් උත්තමයා දැක ''අද අපගේ දේවතාවාණෝ රුකින් බැසපූය''. අතින් කිරිපිඬු පිළිගන්ට උන්වනැයි බියපත් ව වෙලෙවී වෙලෙවී ව ගොස් සාමි දියණියන්ට කිව...."

- **ථූපවංසය** -

1. මෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

2. i. මෙහි "උත්තමයා" ලෙස නම් කර ඇත්තේ කවුද?
ii. මෙහි ඇතුළත් උපමාව සහ උපමේය ගෙන හැර දක්වන්න.
iii. ස්ත්‍රී ලිංගික සංඥා නාම දෙකක් දක්වන්න.
iv. පූර්ණා දාසිය උපකල්පනය කරන කරුණ කුමක් ද?
v. පූර්ව ක්‍රියා තුනක් නම් කරන්න.

3. ජීවය කවා හදවත් තුළ කුළුණු බර
   දස්කම් කළා මහිමෙන් සිත් පුබුදු කර
   මේ ගිරි හිසෙන් පෙන්වා දී කුවෙර පුර
   ඉතිහාසයක් මැව්වා යුගයකයට පෙර

i. මෙහි වර්ණිත වස්තුව කුමක් ද?
ii. එය උපමා කර ඇත්තේ කුමකට ද?
iii. මෙහි සඳහන් ස්ථානයේ දක්නට ඇති ලක්ෂණ දෙකක් ලියන්න.
iv. ඉතිහාසය යන්නෙහි අර්ථය කුමක් ද?
v. මෙම ස්ථානයේ මැවුම්කරු වන්නේ කවුද?

4. නිල් දෙරණේ තුරුලිය මත මල් සම්පත අම්මා
   තුරුලිය මත පිපි කුසුමේ පල සම්පත අම්මා
   සිය දහසක් නෙක ලෝ දා එළිය කරන අම්මා
   සොළොස් කලා පිරි පුරහඳ එළිය කරන අම්මා

i. මව වෙනුවෙන් යොදා ඇති උපමා දෙකක් ලියා දක්වන්න.
ii. දෙරණ, තුරුලිය, කුසුම්, නෙක යන වචනවල අර්ථ ලියන්න.
iii. පුරහඳ යන්න විශේෂ කර ඇත්තේ කෙසේ ද?
iv. පූර්ව ක්‍රියා පද දෙකක් නම් කරන්න.
v. ආධාර විභක්ත්‍යන්ත පද දෙකක් නම් කරන්න.

## 2. ලක්ෂ්‍යාර්ථය වටහා ගැනීම

භාෂාවේ වාච්‍යාර්ථයෙන් මතුවන අදහස ඔස්සේ අවබෝධ කර ගත හැකි දෙවැනි අරුත, වඩා සංකල්ප සහිත සැඟවුණු අර්ථ ලක්ෂ්‍යාර්ථය වේ. එවැනි අර්ථ සහිත වචනවල අර්ථ අවබෝධ කර ගැනීම ලක්ෂ්‍යාර්ථය වටහා ගැනීම යි.

**මගේ නිවස පිහිටා ඇත්තේ දේවාලේගම හන්දියේ.** යන්නෙහි හන්දියේ ගෙවල් පිහිටීමක් නැත. එහි දෙවැනි අරුත වන්නේ දේවාලේගම හන්දිය සමීපයේ පිහිටා ඇති බවකි. ලක්ෂ්‍යාර්ථය යනු එය යි. **පොඩි හාමුදුරුවෝ බෝධියේ.** යන්නෙහි බෝධිය මත සිටීමක් නොව බෝධිය සමීපයේ සිටීම අදහස් කරයි.

## 3. ව්‍යංග්‍යාර්ථය වටහා ගැනීම

භාෂාව, වාච්‍යාර්ථය කිසි සේත් ම ඉස්මතු නො වන ආකාරයට යෙදිය හැකි ය. ව්‍යංග්‍යාර්ථවත් බස යනු එය යි. ව්‍යංග්‍යාර්ථවත් බස අවබෝධ කර ගත හැක්කේ සමස්ත ප්‍රකාශනය මත ය. උක්ති හා යෙදුම් ඊට ඇසුරු කෙරේ. විශේෂයෙන් කාව්‍යකරණයේදී හමුවන්නේ මෙම ව්‍යංග්‍යාර්ථවත් බස යි.

**මා හඬනා කඳුළු ගලා**
**සැදුණු කඳුළු සාගරේ**
**ඔබ ඇය හා**
**ඔරු පැද පැද**
**සිනාසුණේ ඇයි**

පෙම්වතා හැර ගිය විරහිනියකගේ ශෝකාලාපයකි, මෙය. තමන් දුකෙහි රන්දා තවත්

පෙම්වතියක වෙත ගොස් ඇය හා සතුටින් කල් ගෙවන පෙම්වතා ඇමතීම මෙහිදී සිදු ව ඇත. එහෙත් එසේ නො කියන කවියා ව්‍යංග්‍යාර්ථවත් ව එය මේ පාඨයෙන් ප්‍රකාශ කර ඇත.

පෙම්වතුන් දෙදෙනෙකු තම ජීවිතයට එක් වුවත් තමන් අසතුටින් දිවි ගෙවන බව හැඟවෙන මේ ප්‍රකාශය කෙතරම් ව්‍යංග්‍යාර්ථවත් ද?

**හිරු සඳු එක වර දෙපස නැගේ**
**කළුවර ඇයි විජිතය ම මගේ**

ව්‍යංග්‍යාර්ථාවබෝධයේදී භාෂා පටුත්වය, පාරිසරික හා සංස්කෘතික ඥානය සේ ම අත්දැකීම් බහුල බව ද වැදගත් වේ.

අර්ථාවබෝධයේදී ඉහත දැක්වූ වාච්‍යාර්ථය වටහා ගැනීම, ලක්ෂයාර්ථය වටහා ගැනීම, ව්‍යංග්‍යාර්ථය වටහා ගැනීම යන අවස්ථා තුනෙන් බැහැර ව සුවිශෙෂ ව අර්ථ වටහාගත යුතු අවස්ථා ද ඇත. ඒ අතර ගැඹුරු ධර්ම කරුණක් හෝ වෙනත් සංකල්පයක් සඟවා අරුත් පෙන්වා ඇති තැන් දැක්විය හැකි ය. දහම්ගැට මාලය නම් පැරණි ධර්ම ග්‍රන්ථයේ සඳහන් මේ පද්‍යය අවධානයට ගන්න.

**ඉස්සන් මරාපිය**
**රා කළයක් ම බීපිය**
**මෝ ව මරවා පිය**
**මෙතුන කරලා මාව කාපිය**

මෙය බැලූ බැල්මට සරල මතුපිට අදහසක් පෙන්නුම් කළ ද මෙහි ගැබ් ව ඇත්තේ ගැඹුරු ධර්ම කරුණකි. මින් කියවෙන්නේ ඊර්ෂ්‍යාව, රාගය, මෝහය නැති කොට නිවන අවබෝධ කරගන්නා ලෙස යි. මෙවැනි අරුත් පහදා ගැනීම් ගුරුපදේශ සහිත ව ම කළ යුතු ව ඇත.

එමෙන් ම අර්ථාවබෝධය ලැබීමේදී ප්‍රදේශීය භාෂා විෂමතාවන් ගැන ද අවබෝධය ලබා තිබීම වැදගත් වේ. භාෂාව ලේඛනගත කිරීමේදී ප්‍රදේශීය අනන්‍යතාව ලේඛකයා සතු ව පවතී. එම නිසා ප්‍රදේශීය වශයෙන් පවතින වාග් මාලාවන් හි විෂමතාවත් ඒ ඒ වචනවල අර්ථත් වටහා ගෙන සිටීම අවශ්‍යතාවකි.

වාච්‍යාර්ථය සහ ලක්ෂ්‍යාර්ථය යන දෙකෙහිදී ම නිශ්චිතාර්ථයක් ගම්‍ය වුව ද ව්‍යංග ්‍යාර්ථය දනවා ගත හැක්කේ රසඥතාව සහ අද්දැකීම්වල ස්වභාවය මත යි. එය පුද්ගල බද්ධ විය හැකි ය.

## අර්ථාවබෝධයට අත්වැල

1. ගද්‍ය හෝ පද්‍ය පාඨය හොඳින් කියවීම

2. අර්ථ සංකීර්ණ වචන, යෙදුම් ඇත්නම් ඒවා සලකුණු කිරීම

3. එම අර්ථ සංකීර්ණ වචන හා යෙදුම්වල අර්ථ වටහා ගැනීම. ඒ යටතේ
   වාච්‍යාර්ථ
   ලක්ෂ්‍යාර්ථ
   ව්‍යංග්‍යාර්ථ ගැන අවධානය යොමු කිරීම

4. මුඛ්‍ය අදහස/ තේමාව වටහා ගැනීම

5. මුඛ්‍ය අදහසට/ තේමාවට සම්බන්ධ සමස්ත අදහස වටහා ගැනීම

6. අන්තර්ගත කරුණු සංකල්පීය වශයෙන් හා නාමික වශයෙන් හඳුනා ගැනීම

7. ව්‍යාකරණ ලක්ෂණ හඳුනා ගැනීම

8. අන්තර්ගතයට අදාළව අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී ප්‍රශ්න මනාව තේරුම් ගැනීම

9. විස්තර කළ යුතු කරුණු ඔබේ වචනයෙන් ඉදිරිපත් කිරීම

10. යමක් පිළිබඳව ඔබේ මතය විමසා ඇත්නම් එය නොපැකිලිව ඉදිරිපත් කිරීම

11. ඔබේ පිළිතුර නිශ්චිතව, කෙටියෙන් සහ පැහැදිලිව දැක්වීම

## ක්‍රියාකාරකම 2

**පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨවල අර්ථය ලිහිල් බසින් ලියන්න.**

1. සොර ක්ලාන්ත වියැ. මියෙහි කෙළ සිඳී ගියෙ. ශරීරයෙන් ස්වේද බස්සි. එක ලැ අඟුල්මල් සොර විස්මිත වැ "මම් පූර්වයෙහි දිවෙන ඇතුන් ලුහුබැඳැ ගනිම් මැ යැ. අසුන් ලුහුබැඳැ ගනිම් මැ යැ. රථ ලුහුබැඳැ ගනිම් මැ යැ. දිවෙන මුවන් ලුහුබැඳැ ගනිම් මැ යැ එතෙකුදු හොත් මම් මෙ මහණහු පියෙවි ගමනින් යන්නහු බැල පමණින් දිවෙනුයෙම් හඹා නොගත හෙම්'' යි......"

**(අමාවතුර අඟුල්මල් දමනය)**

2. ඒ අසා ආලවකයා විස්මය පත් වැ "මත්තෙහි අනික් කා විචාරන්නට තබම් ද විචාරණ දෙයක් මොවුන් වහන්සේ මැ විචාරමි'' යි සිතා විචාරන්නේ "කාම යැ, භව යැ, දෘෂ්ටි යැ, අවිද්‍යා යැ යන මේ සතර වතුරෙන් සත්ත්ව තෙම කෙසේ එතෙර වන්නේ දැ'' යි විචාළේ. ඉක්බිති සර්වඥයන් වහන්සේ "ආලවකය සත්ත්ව තෙමේ මේ තා කී සතර වතුරෙන් එතෙර වන්නේ තුණුරුවන්හි කරන සැදැහැයෙන් මැ ය'' යි වදාළ සේක......

**(බුත්සරණ - ආලවක දමනය)**

3.
දිලිහෙන ගඟු ලැලීය ඇද හැලීය
ගිලිමල් රොනවුලීය සුදු වැලීය
මදමත් හස කැලීය වන විලීය
දැක යව මන කලීය වන මලීය

**(ගිරා සන්දේශය)**

4. ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට
දුසිරිත් දනන් දෙන - ඔවා වැද්දන් කියන බණ වැනි

**(ලෝකෝපකාරය)**

5. කුළුණු ගුණෙන් යුතු උතුමන් සිත මහරු
දුදන බසින් නොයෙදෙයි කරනට නපුරු
නවරුවනින් පිරි මහ සමුදුර ගැඹුරු
තණ සුළෙකින් හුණු කළ හැකි වෙති කවුරු

**(සුභාෂිතය)**

## ක්‍රියාකාරකම 3

**පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. සංස්කෘත ශාබ්දික නියමය අනුව සාවද්‍ය බව ප්‍රකට වන ඇතැම් රූප මේ වන විට සිංහල ව්‍යවහාරයෙහි මුල් බැස ඇති බව පෙනී යයි. "ප්‍රාදේශීය" යනු එබන්දකි. ප්‍රදේශ යන පදය සමග ඊය ප්‍රත්‍යය එක් වීමෙන් සැදෙනුයේ "ප්‍රදේශීය" යනු විනා "ප්‍රාදේශීය" යන්නක් නොවේ. ඇතැම්විට මෙය 'ඉක' ප්‍රත්‍යයට අදාළ ප්‍රදේශික යන වචනයේ ආදි ස්වරයේ වෘද්ධිය අයථා සාදෘශ්‍යයෙන් යොදා ගැනීමෙන් සකස් කොට ගත්තක් විය හැකි ය.

   i. සංස්කෘත ශාබ්දික නියමය අනුව මෙහි ඇති සාවද්‍ය රූපය කුමක් ද?
   ii. එහි නිරවද්‍ය රූපය දක්වන්න
   iii. ඊය ප්‍රත්‍ය යෙදුණු වෙනත් වචන දෙකක් ලියන්න
   iv. සංස්කෘත ශාබ්දික නියමය යනු කුමක් ද?
   v. ස්වර වෘද්ධිය යනු කුමක් ද?

2. නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම සීමා කරන නුවුමනා නීති රීති ජන කවියාට නැත. ජනකවියා සිතීමේදී හා අදහස් ප්‍රකාශ කිරීමේදී උගත් කවියාට වඩා නිවහල් ය. උගත් කවියා තතන තතනා ප්‍රකාශ කරන දේ ජන කවියාගෙන් ප්‍රකාශ වන්නේ නිතැතිනි. ජනකවියාගෙන් සිදු වන්නේ ජලයෙන් පිරී ඉතිරී යන විට වැව් කන්ද කඩා බිඳ ගෙන යන වැවක් මෙන් අදහස් වැඩි වූ විට එම අදහස් කවි බසට නැගී ගලා යාම යි.

   i. ජන කවියා උගත් කවියාගෙන් වෙනස් වන්නේ කෙසේ ද?
   ii. උගත් කවියා උත්සාහයෙන් කරන දේ ජන කවියා කරන්නේ කෙසේ ද?
   iii. මෙහි සඳහන් උපමාව සහ උපමේය ගෙන හැර දක්වන්න.
   iv. විශේෂ පද දෙකක් සහ උපසර්ග සහිත පදයක් ලියා දක්වන්න.
   v. මේ ඡේදයේ මුඛ්‍ය අදහස කුමක් ද?

3. මල් රොන් තුරු සිරේය නිරතුරේය
පවනද වැද සිරේය මළු තුරේය
බිඟු ලොබ කර තරේය නොවිතරේය
දම් පිළිරැව් යුරේය නද කෙරේය

**(ගිරා සන්දේශය)**

   i. සුළං වැදී මිදුල මත ඉහිරී යන්නේ මොනවා ද?
   ii. ධර්මය පිළිරැව් දෙන්නාක් ලෙස දක්වා ඇත්තේ කුමක් ද?

iii. මෙම වර්ණාවට මුල් වී ඇත්තේ කුමන ස්ථානයක් ද?
iv. විශේෂණ පදයක්, පූර්ව ක්‍රියා පදයක්, උපසර්ග සහිත පදයක් දක්වන්න.
v. මෙහි ඇති මුඛ්‍ය අදහස පිළිබඳ ඔබට හැඟෙන්නේ කුමක් ද?

4. හැම මලකින් ම රොන් ගෙන සදන මී පැණි
ලෙඩ සුව කරන දිව ඔසුවක් වන හෙයිනි
ලොව දුටු හැම දෙයින් පාඩම් ගතොතිනි
වැඩි වෙයි නුවණ දින දින පුරහඳ ලෙසිනි

i. මී පැණි හදන්නේ කෙසේ ද?
ii. මී පැණි එතරම් වටින්නේ ඇයි?
iii. නුවණ වැඩි වීමට හේතු වන කරුණ ලෙස දක්වා ඇත්තේ කුමක් ද?
iv. නුවණ වැඩි වීම උපමා කර ඇත්තේ කුමකට ද?
v. මෙහි සමස්ත අර්ථයෙන් කුළු ගැන්වෙන්නේ කුමක් ද?

## iqNdIs;

**"නික්කාරණා දුලලභා අජ්ජමිත්තා"**

ආත්මාර්ථයක් නැති ව නිකරුණේ මිතුරුවන්නෝ
මෙකල්හී දුර්ලභ ය

## iqÑka;k

සිතිවිල්ලක් වපුරන්න
ක්‍රියාවක් ලැබේ.
ක්‍රියාවක් වපුරන්න
පුරුදු ලැබේ.
පුරුදු වපුරන්න
චරිතය ලැබේ.
චරිතය වපුරන්න
දෛවය ලැබේ.